www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 50 S

නම ..............................................

නාට්‍ය හා රංග කලාව I කොටස

කාලය පැය දෙකයි

උපදෙස්
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. පහත සඳහන් කතා අතරින් ජන කතාවක් වන්නේ,
   1. හීල්බත්දංකුඩ   2. මනමේ   3. නරි බෑනා   4. කුවේනි

02. මෙයින් ජන කතාවක් නොවන්නේ,
   1. වෙස්සන්තර   2. නාඩි බැලීම   3. යකාගේ දත් හිටවීම   4. ගමදෝණිගේ චාරිත්තරේ

03. අනුකරණ කළ හැකි ස්වභාවික සිදුවීමකි,
   1. වෙළඳපොල   2. රිය අනතුර   3. පංති කාමරය   4. මල් පිපීම

04. චරිතයක් ඒ අයුරින්ම නිරූපණය කර දැක්වීම,
   1. රඟපෑම යි   2. අනුකරණය යි   3. සමාරෝපය යි   4. අභිරූපණය යි

05. නාට්‍යයක් නරඹන පුද්ගලයා,
   1. ප්‍රේක්ෂකයා   2. ශ්‍රාවකයා   3. රසිකයා   4. රචකයා

- නොගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

06. කතාන්දරයක දැකිය හැකි ලක්ෂණ වේ.
   1. සිද්ධි මාලාව   2. රංගවිධාන   3. අසාරස විදීම   4. සරල භාෂාව

07. විහාර මහා දේවි කතාව,
   1. වීර කතාව කි.   2. විදේශීය උපමා කතාව කි.
   3. ඉතිහාස කතාව කි.   4. දේශීය කතාව කි.

- හිස්තැනට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.
  (එළුවන් කෑම, භූමිකා, අභිරූපණ, අනුකරණය)

08. චරිතයක් තුළ ........................................ කීපයක් දැකිය හැකිය.

09. සත්ව චර්යා මිනිසුන්ට ........................................ කළ හැකිය.

10. ........................................ ජන ක්‍රීඩාවකි.

- පහත වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ද ලකුණ ද යොදන්න.

11. සිරිත් මල් දම තුළින් ජීවිතයට ආදර්ශ ලබාගත හැකිය. (      )

12. ජන කතා ඇසුරෙන් රසවත් නාට්‍ය නිර්මාණය කළ හැකිය. (      )



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

13. නාට්‍ය පිටපතක සංවාද දක්නට නොලැබේ. (        )

14. වේදිකා නාට්‍ය නැරඹීම තුලින් දැනුම අඩු වේ. (        )

15. නාට්‍ය ඉදිරිපත් කරන ස්ථානය රංග භූමියයි. (        )

● **ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 16. පුංචි අපට දැන් තේරෙයි | චරිත |
| 17. කතාන්දරය | වැස්ස |
| 18. නාට්‍ය පෙළ | රංග ක්‍රීඩා |
| 19. පරිසරය | සෝමලතා සුභසිංහ |
| 20. සබකෝලය දුරුවීම | අසා රස විඳියි |

(ල. 1 x 20 = 20)

## II කොටස

**පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු ලියන්න.**

01. i. ඔබ දන්නා ජන කතා දෙකක් නම් කරන්න. (ල. 02)
    ii. ඉන් එක ජනකතාවක චරිත ලියා දක්වන්න. (ල. 02)
    iii. ජනකතා වලින් ලැබෙන ආදර්ශ දෙකක් ලියන්න. (ල. 02)
    iv. එම ජන කතාවේ අවස්ථාවක් චිත්‍රයට නගන්න. (ල. 04)

02. i. වැසි දිනයක පරිසරයේ ඇතිවන සිදුවීම් දෙකක් ලියන්න. (ල. 02)
    ii. ජීවිතයේ ඔබට දැනුන සතුටු හෝ දුක්බදායි අත්දැකීම් තුනක් ලියන්න. (ල. 03)
    iii. ස්වභාවික පරිසරය පිළිබඳව ගීතයක් ලියන්න. (ල. 05)

03. i. පහත සඳහන් චරිත කට්ටලයක් තෝරාගෙන ඔබ කැමැති චරිතය ද එක්කර ගනිමින් කුඩා දෙබසයක් නිර්මාණය කරන්න.
    ❖ ගුරුවරයා හා සිසුවා
    ❖ මල හා මී මැස්සා
    ❖ වෙළෙන්දා සහ පාරිභෝගිකයා (ල. 05)

    ii. ඔබ දෙබසට ගැළපෙන පරිදි අදාළ චරිත වලට ඇඳුම් හා ආභරණ කට්ටල දෙකක් අඳින්න. (ල. 05)

04. අනුලාගේ ස්වාමි පුරුෂයා වන සිරිල් වෘත්තියෙන් ගුරුවරයෙ කි. ඔහුගේ පුතා 6 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. සිරිල් පන්සලේ දායක සභාවේ සාමාජිකයෙකු වන අතර සුභ සාධක සංගමයේ සභාපතිවරයා ද වේ. ඔහු නිතර ගමන් කරන්නේ බසයෙ නි.
    i. සමාජයේ ඔබට හමුවන චරිත හතරක් ලියන්න. (ල. 2)
    ii. භූමිකාවක් යන්න හඳුන්වන්න. (ල. 3)
    iii. ඉහත ඡේදය ඇසුරින් භූමිකා ප්‍රස්තාරයක් අඳින්න. (ල. 5)

05. ඔබ දන්නා නාට්‍ය ගීතයක් ලියා එම ගීතය අයත් නාට්‍යයේ නම ලියන්න. (ල. 10)



Agaram.LK - Keep your dreams alive!
agaram.lk